**ශීර්ෂය 198 - වාරිමාර්ග අමාත්‍යාංශය**

**-------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

-----------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------**

වාරිමාර්ග අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුලි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

**------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**(අ) පුනරාවර්තන වියදම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් රු.100,036,149 ක් ලෙස දක්වා තිබුණද එම වටිනාකම රු.6,355,033,487 ක් විම නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය රු.6,254,997,338 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ශේෂ පිරික්සුම අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් ලෙස රු. 100,036,149 ක් වගු අංක 01 පරිදි ගණනය කර ඇත. රු. 6,257,018,350 ක් භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත්කර ගැනීම් වන බැවින් පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්හි ඇතුළත් කර නොමැත. | මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ නිවැරදිව දැක්විමට කටයුතු කළ යුතු වේ. |
| (ii) | සහනාධාර මාරු කිරිම් රු.10,314,847 ක් වුවද, මුදල් ප්‍රවාහයේ රු.10,423,489 ක් ලෙස දක්වා තිබීම නිසා රු.108,642 ක් මෙහෙයුම් හා සහනාධාර මාරු කිරිම් මුදල් ප්‍රකාශයේ වැඩියෙන් දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්හි ඇතුළත් විය යුතු රු. 108,642 ක් වැරදීමකින් සහනාධාර මාරුකිරීම්හි ඇතුළත් වීමෙන් පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් එම අගයෙන් අඩුවී, සහනාධාර මාරුකිරිම් එම අගයෙන් වැඩි වී සමස්ත වියදම එමගින් ගැලපි ඇත. | මූල්‍ය ප්‍රකාශනවල මුදල් ප්‍රවාහය නිවැරදිව දැක්විය යුතු වේ. |

**(ආ) මූලධන වියදම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ භෞතික වත්කම් ඉදි කිරිම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත් කර ගැනීම් රු.6,257,018,350 ක් ලෙස දක්වා තිබුණ ද භාණ්ඩාගාර සටහන් අනුව රු.2,221,417 ක් වුයෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය රු.6,254,796,933 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ශේෂ පිරික්සුමට අනුව භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් රු.6,257,018,350 ක් බව දක්වමි. | භාණ්ඩාගාර සටහන් අනුව සැසදුම් කර නිවැරදි අගයම දැක්වීමට කටයුතු කළ යුතු වේ. |

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශයේ දේපල පිරියත සහ උපකරණ ආරම්භක ශේෂය රු.432,177,817 ක් වුවද , ගිණුම සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිලිබඳ ප්‍රකාශයෙහි (ඒ.සි.ඒ.06) රු.432,588,643 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.410,826 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ශේෂය නිවැරදි වන අතර 9152 වත්කම් කාණ්ඩය යටතේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි (ඒ.සි.ඒ.06) ආරම්භක ශේෂය ද්විගණනය වී ඇති බව පිළිගනිමි. | මූල්‍ය ප්‍රකාශය පිලියෙල කිරිමේදී සන්සන්දනාත්මකව පරික්ෂා කර නිවැරදි තොරතුරු ඇතුලත් කිරීමට කටයුතු කල යුතු වේ. |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **බැරකම් ලේඛනය**<br>මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි | ඉදිරියේදී මෙම ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කරන බව දන්වමි. | බැරකම් ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කල යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉටුකිරීමට සැලැසුම් කරන ලද කාර්යයන් සඳහා රු.8,585,372,000 ක අග්‍රිම මුදලක් ඉල්ලුම් කර තිබුණ ද මහා භාණ්ඩාගාරය විසින් රු.6,589,060,136 ක් නිදහස් කර තිබුණි. ඒ අනුව ඉල්ලුම් කරන ලද අග්‍රිමයෙන් සියයට 23 ක් ලැබී නොතිබුණි. | 2020 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා ඉල්ලුම් කළ අග්‍රිමයෙන් ලද ප්‍රමාණය වන සියයට 77 නිවැරදි බවට පිළිගනිමි. | අයවැය ලේඛන පාලන විචලතා අවම වන පරිදි පුරෝකථනය සිදු කල යුතු වේ. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වියදම් ශීර්ෂ 03 ක් සඳහා සලසන ලද මුළු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.1,300,000 ක් උපයෝජනය නොකර සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. | මෙම වෙන් කිරීම සිදු කළ ද වසර අවසන් වන තුරුත් ලොව පුරා පැවති කොවිඩ්-19 වසංගතය මත විදේශ ගමන් සිදු නොවීම, වරිපනම් ලේඛන නිසි පරිදි නොලැබීම මත ගෙවීම් සිදු නොවීම, යන්ත්‍ර 10 ක යන්ත්‍රෝපකරණ භාවිතය අඩු වීම යන කරුණු හේතු වී තිබුණි. | ප්‍රතිපාදන උපයෝජනය කිරීමට කටයුතු කල යුතු වේ. |

| | | |
|---|---|---|
| (ආ) ඇස්තමේන්තු සකස්කිරීමේ දී අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව වෙන්කිරීම් සිදු කිරීම සහ සැලැසුම් කරන ලද පරිදි වැඩ කටයුතු සිදු නොකිරීම යන හේතු නිසා වැය විෂයයන් 10ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු.20,125,000 ක් වූ ශුද්ධ වෙන්කිරීම් වලින් එකතුව රු.8,698,120 ක් හෙවත් සියයට 43 ක් ඉතිරි වී තිබුණි. වැය විෂයයන් යටතේ වූ ඉතිරිය සියයට 20 ත් සියයට 96 ත් අතර පරාසයක් ගෙන තිබුණි. | කොවිඩ්19 තත්ත්වය හේතුවෙන් කාර්යාල වසා තැබීම සහ රෝස්ටර් ක්‍රමයට නිලධාරීන් සේවයට කැඳවීම මත ඇස්තමේන්තු කළ පරිදි වියදම් ඇති නොවීය. | වෙන් කරන ලද ප්‍රතිපාදන උපරිමව උපයෝජනය කිරීමට කටයුතු කල යුතු වේ. |

**2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

**--------------------------------**

| **විගණන නිරීක්ෂණය**<br>---------------------- | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>-------------------------------------- | **නිර්දේශය**<br>----------- |
|---|---|---|
| චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව 2020 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් ප්‍රමාණය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරන ලද තොරතුරු පද්ධතිට දිනපතා යාවත්කාලීන කිරීම සඳහා සෑම වියදම් ඒකකයක් විසින්ම බැඳීම් බැරකම් හා එම බැරකම් නිදහස් කිරීම් පිළිබඳ තොරතුරු එම වෙබ් අඩවියට උත්පනය (Up lord) කළ යුතු බවට උපදෙස් ලබා දී තිබුණ ද ඊට අනුකූලව එම තොරතුරු යාවත්කාලීන කර නොතිබුණි. | වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති 15 න් , ව්‍යාපෘති 2 ක් පමණක් CIGAS පද්ධතිය හා ගිණුම් කටයුතු සිදු කරනු බැවින් ව්‍යාපෘති වල බැරකම් මාසිකව එකතු කර මාසික අත්මුදල් ලබා ගැනීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සිදු වේ. වාරිමාර්ග අමාත්‍යාංශය ITMIS පද්ධතිය අනුව ගිණුම් තැබීමට කටයුතු කරන බැවින් මෙම ගැටළුව නිරාකරණය වනු ඇත. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255 / 2017 ට අනුකූලව බැරකම් පිළිබඳ වාර්තා කල යුතු වේ. |

## 2.4 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ණය මුදල් ගෙවා අවසන් වීමට පෙර විශ්‍රාම ගන්නා වූ හෝ මිය යන්නා වූ හෝ සේවය අවසන් වන්නා වූ හෝ නිලධාරින්ට අදාළ ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.2 , 4.2.4 , 4.2.5 , 4.3 , 4.4 , 4.6 හා 6.3 වගන්ති අනුව කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට රු.1,443,234 ක් අය නොවූ ණය ශේෂයක් පැවතුණි. | මෙම ශේෂ 2021 වර්ෂයේදී නිරවුල් කිරීමට උපදෙස් ලබාදී ඇති අතර, අයකර ගත නොහැකි ශේෂ කපාහැරීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරමින් පවතී.<br>අයකරගත නොහැකි ණය ශේෂ අයකරගැනීම පිළිබඳව නීතිපති වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම ශේෂ නෛතික ක්‍රියාමාර්ගයකින් අයකර ගැනීම ඵලදායී නොවන බැවින් එම ශේෂ කපාහැරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස නීතිපති දෙපාර්තමේන්තුවෙන් දන්වා ඇති බැවින් ඒ අනුව කපාහැරීම සඳහා කටයුතු කරමින් පවතී. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂා වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම | | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (i) | මු.රෙ 134 (2) DMA/1-2019 | මුදල් රෙගුලාසි ප්‍රකාරව වර්ෂය ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | වාර්ෂික විගණන සැලැස්ම විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා අතර 2021 වර්ෂයට අදාල විගණන සැලැස්ම සඳහා 2021 පළමු කාර්තුවේ පැවති විගණන හා කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලබාගෙන ඇත. | අභ්‍යන්තර විගණන සැලැස්ම විගණකාධිපතිවර යාගේ එකඟත්වය ලබාගෙන සකස් කිරීමට කටයුතු කල යුතු වේ. |
| (ii) | මුදල් රෙගුලාසි 571 (2) (3) | මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂා කර බලා කල් ඉක්මවූ තැන්පතු ආදායමට ගත යුතු වුවත් එලෙස සිදුකර නොතිබුණි. | වසර දෙක ඉක්මවූ එක් කොන්ත්‍රාත්කරුවකුට අදාළ රු.1,251,774 ක තැන්පතුවක් පවතින අතර වෙනත් කොන්ත්‍රාත්කරුවකු මඟින් එම කොන්ත්‍රාත්තුව නිම කිරීමේ කටයුතු සැලසුම් කර තිබූ බැවින් රජයේ අදායමට බැර කර නොතිබුණි. | තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2014 මැයි 11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරිමේදී ගණකාධිකාරවරයා ගේ පාලනයට යටත්ව කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හා එක්ව මුර පද මාරු කිරිමට කටයුතු කරමින් පවති. | ගණකාධිකාරීවර යාගේ පාලනය යටතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල ඉන්ධන දහනයවීම නැවත පරික්ෂා කිරීමේ කටයුතු පවතින කොවිඩ්-19 වසංගත තත්ත්වය අවසන් වූ වහාම සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ඉන්ධන දහනය චක්‍රලේඛය ප්‍රකාරව පරීක්ෂා කිරීමට කටයුතු යුතු වේ. |
| **(ඇ)** | අංක 05/2008 දරන හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය | පුරවැසි/සේවාලාභි ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ වන විට අනෙකුත් අංශ වෙතින් අදාල තොරතුරු කැදවා ඇත. නමුත් රටේ පවතින වසංගත රෝග තත්වය හේතුවෙන් අවසන් අදියරකට එළඹීමට නොහැකි වී ඇත. ඒ අනුව පුරවැසි / සේවාලාභි ප්‍රඥප්තියක් සම්පාදනය කොට කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාල චක්‍රලේඛ විධිවිධානයන්ට අනුකුලව පුරවැසි සේවාලාභි ප්‍රඥප්තිය සකස් කර ක්‍රියාවට නැංවිය යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීමෙ** | **නිර්දේශය** |
|---|---|---|
| දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය ප්‍රසම්පාදන ලේඛනයේ 32.1 ඡේදයට අනුකූලව සාම්පල නියැදි පරික්ෂාවන් සිදු කල යුතු වුවද, රු.42,494,417 ක් වැය කර මුතූර් ඇල්ලෙයි යෝජනා ක්‍රමයේ වම් ඉවුර 02 ඇල බැම්ම මත වූ මාර්ගය හා ප්‍රධාන ඇල බැම්ම මත වූ මාර්ගය පස් පුරවා බොරළු අතුරා සංවර්ධනය කිරීමේදී ඒ සඳහා යොදාගත් පස් හා බොරළු නියමිත ප්‍රමිතියෙන් යුතු බවට හා ඒවා නියමිත පරිදි යන්ත්‍ර මඟින් තද කර ඇති බවට වූ සාම්පල් පරීක්ෂණ වාර්තා ලබාගෙන නොතිබුණි. තවද මෙම මාර්ගයන්හි කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අදාල මාර්ගයන්හි පස් සෝදා ගොස් මඩ වගුරු නිර්මාණය වී තිබූ බව නිරීක්ෂණය විය. | පස් හා බොරළු සම්බන්ධයෙන් සාම්පල් පරීක්ෂණ වාර්තා ලබාගෙන මෙම ඇල බැම් මතින් අනවසර වැලි ලොරි ගමන් ගන්නා බවත් මෙම තත්ත්වය පාලනය කල නොහැකි මට්ටමක පවතින බවත් ඒ සම්බන්ධයෙන් මුතූර් පොලිස් ස්ථානයටද පැමිණිලි කර ඇතත් මේ දක්වාම ක්‍රියාමාර්ග ගෙන නැත. අනවසර වැලි ලොරි ගමන් ගන්නා බැවින් විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි මාර්ගයන්හි අබලන් තත්ත්වයන් පවතින බව ත්‍රිකුණාමලය වාරිමාර්ග අධ්‍යක්ෂවරයා විසින් පෙන්වා දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) අල්ලෙයි යෝජනා ක්‍රමයේ දකුණු ඉවුරේ මාර්ගය, කන්තලේ වෙන්ද්‍රසන් ප්‍රධාන ඇලේ ප්‍රධාන ඇල මාර්ගය සහ පාකිරන්වෙට් නව මාර්ගය දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.19,705,471 ක වියදමින් සංවර්ධනය කර ඇත. කෙසේ වෙතත්, ඉහත සඳහන් මාර්ගවල | ත්‍රිකුණාමලය වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කරන ලද පැහැදිලි කිරීම් වලට අනුව මෙම මාර්ගයන්හි සංවර්ධන වැඩ 2017 මාර්තු මස ආරම්භ කර 2018 ජූනි මස අවසන් කර ඇත. ඊට වසර 2 ½ කට පමණ පසුව එනම් 2020 මැද භාගයේදී පමණ මෙම මාර්ගයන් අවට ජීවත් වන ජනතාවගේ බලවත් ඉල්ලීම මත හා වාරිමාර්ග | නිමකර ඇති මාර්ගයේ කොටස් නැවත කොන්ත්‍රාත් දීමට කටයුතු නොකළ යුතු අතර එලෙස සිදු කිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගතයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | මීටර් 400 ක් මීටර් 2850 ක් සහ මීටර් 100 ක් පිළිවෙලින් වෙනත් සංවර්ධන ව්‍යාපෘතියක් යටතේ කාපට් අතුරා කොන්ක්‍රීට් කර තිබුණි. ඒ අනුව මෙම මාර්ග සංවර්ධනය සඳහා ව්‍යාපෘතිය යටතේ වැය කළ මුදල අනාර්ථික වියදමක් විය. | දෙපාර්තමේන්තුවේ අවසරය මත මාර්ගයන්හි කොටස් කාපට් අතුරා ඇත. | |
| (ආ) | කන්තලේ පෙරාරු මාර්ගයේ රු.468,285 ක් වැයකර බෝක්කු දෙකක් ඉදිකර තිබුණද, අදාළ පාරවල් මේ දක්වා ඉදි කර නොතිබීම හේතුවෙන් එම බෝක්කු දෙක වර්ෂ දෙකක් තිස්සේ භාවිතා කර නොතිබුණි. | හඳුනාගන්නා අධියරේදී ගොවි සංවිධාන විසින් බෝක්කු දෙකක් ඉදිකර දෙන මෙන් ඉල්ලා සිටි බවත් ඊට අදාල මාර්ගයන් ගොවි සංවිධානයේ මුදල් හා ශ්‍රම සහභාගිත්වය මත ඉදිකර ගන්නා බවටත් එකඟ විය. කෙසේ වුවද කොවිඩ් 19 වසන්ගතය හමුවේ ඔවුන්ගේ මූල්‍ය ශක්තිය පිරිහී යාමත් ගොවින්ට ඒ සඳහා යොමු වීමට කාලයක් නොමැති වීමත් මත මෙම බෝක්කු දෙකට අදාල මාර්ගයන් ඉදිකිරීමට නොහැකි වී ඇත. ඒ හේතුවෙන් මෙම බෝක්කු දෙක මේ දක්වා ප්‍රයෝජනයට ගත නොහැකිව පැවතුණි. | කොන්ත්‍රාත්තුවටම අදාළ මාර්ගද සංවර්ධනය කල යුතු වේ. |

**3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වාරිමාර්ග අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කර ඇති මහවැලි වම් ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කින්නියා හා කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ඉඩම් අක්කර 6000 කට වාරි ජලය සැපයීම සහ ඝන මීටර් මිලියන 2 ක පානීය ජලය සැපයීම ව්‍යාපෘතියේ අරමුණ විය. 2020 දෙසැම්බර් 31 දිනට රු.134,955,993 ක් වියදමක් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ. | | |

| | | | |
|---|---|---|---|
| (i) | වාරිමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කර අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව මේ සඳහා දැනටත් ශක්‍යතා අධ්‍යයන ඉටුකර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ (Department of National Planning) අනුමැතිය ලබාගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 90 ක විදේශ ණය ලබාගැනීම සඳහා වන ණය ගිවිසුම මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා සෞදි අරමුදලේ නියෝජිතයන් සමඟ 2017 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ දී අත්සන් කර තිබුණද කන්තලේ සීනි කර්මාන්ත ශාලාවට අයත් ඉඩම් අත්පත් කර ගැනීමේදී මතුව ඇති ගැටළු හේතුවෙන් විදේශ ණය මුදල් ලබා දීම අත්හිටුවා තිබුණි. | කින්නියා ප්‍රදේශයට වාරි හා පානීය ජලය සැපයීම අරමුණු කරගත් ව්‍යාපෘතිය අමාත්‍යාංශය හරහා සවුදි අරමුදල් යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියකි. කන්තලේ සීනි කර්මාන්තශාලාවට අයත් ඉඩම් අත්පත් කරගැනීමේදී මතුව ඇති ගැටළු හේතුවෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පැවැත්වූ සාකච්ඡාවල තීරණයන්ට අනුව විදේශ ණය මුදල් ලබා දීම අත්හිටුවා, දේශීය මූල්‍ය ප්‍රභවයක් මඟින් ක්‍රියාත්මක කිරිම සඳහා වාරිමාර්ග දෙපාර්තමෙන්තුවට පවරා ඇත. | ව්‍යාපෘතිවලට අදාල ඉඩම් පවරා ගැනීම කාලීනව සිදු කර ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ii) | ව්‍යාපෘතියට අදාල පරිසර ඇගයීම් වාර්තාව (EIA) ව්‍යාපෘතිය ආරම්භ කර වසර 4 ක් ඉක්ම වි තිබුණද 2021 අප්‍රේල් 30 දින දක්වා එය සම්පූර්ණ කර නොතිබුණි. | ව්‍යාපෘතියට අදාළ පරිසර වාර්තාව සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුමට එළඹ ඇති අතර එම වාර්තාව 2019 ඔක්තෝම්බර් 28 වන දින වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දී ඇත. එහි පළමු තාක්ෂණ කමිටු රැස්වීම 2020 මාර්තු 11 දින පවත්වා ඇත. එහිදී මතුවූ ගැටළු සඳහා වනජීවී දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ 2020 දෙසැම්බර් 07 වන දින ඉදිරිපත් කර ඇත. තවද, මෙම පරිසර වාර්තාව ලබා දෙන ලෙස සිහිකැඳවීම් ලිපි 02 ක් යවා ඇත. එහෙත්, මෙහි අනුමත කිරීමේ ආයතනය වන, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් තාක්ෂණ කමිටුවේ නිර්දේශ හෝ අදාළ අනුමැතිය මේ දක්වා ලැබී නොමැත. | ව්‍යාපෘතියට අදාළ පරිසර ඇගයීම් වාර්තාව කාලීනව සිදු කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | මෙම ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයෙකු ඇතුළු 27 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් පත් කර 2017 වර්ෂයේ සිට 2020 මැයි මස දක්වා වැටුප් ගෙවා ත්‍රිකුණාමල ප්‍රදේශයේ ව්‍යාපෘති කාර්යාලයක් පවත්වාගෙන ගොස් තිබුණු අතර 2017 සිට 2020 දක්වා කාල සීමාව තුල රු.මිලියන 135 ක් වැය කර තිබුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලද කාර්යයමණ්ඩල අනුමැතිය පාදක කරගනිමින් නිලධාරීන් 27 දෙනෙකුගෙන් සමන්විත කාර්යය මණ්ඩලයක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට බඳවාගෙන තිබුණි.<br>මෙම ව්‍යාපෘතිය අනපේක්ෂිත හේතු නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය කරමි.<br>යෝජිත කළුගඟ ජලාශයට පිවිසුම් මාර්ගය කන්තලේ සීනි කර්මාන්ත ශාලාවට අයත් ප්‍රදේශය හරහා යා යුතු වේ. මෙම පිවිසුම් මාර්ගය කන්තලේ සීනි සමාගමේ ඉඩම හරහා යව බවත්, ඊට විරෝධය දැක්වීම<br>වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා සමඟ ද සාකච්ඡාවට කිහිපයක් පැවැත්වූ නමුත් සාර්ථක වී නැත. මේ සඳහා මුදල් අමාත්‍යාංශය හෝ රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයකට එළඹිය යුතුව ඇත. 2020 වර්ෂයේදී ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPD) මඟින් “ගුණරුවන් ත්‍රි පුද්ගල කමිටුවට” ද ඉදිරිපත් කර ඇති අතර එහිදීද තීරණයක් ගෙන නැත. මෙම ව්‍යාපෘතිය නතර කිරීම හෝ ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව හෝ වාරිමාර්ග අමාත්‍යාංශයට සෘජු වගකීමක් ගත නොහැක. රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයකට එළඹිය යුතුව ඇති කරුණක් ලෙස නිරීක්ෂණය කරමි. | ව්‍යාපෘති කාර්ය මණ්ඩලය විසින් වසර 04 ක් තුල ඉලක්ක ගත අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියාකර ඇති ආකාරයෙහි පවත්නා දුර්වලතා හඳුනාගෙන ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වලක්වා ගැනිමට අවශ්‍ය අභ්‍යන්තර පාලනය ශක්තිමත් කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (iv) | ව්‍යාපෘතිය යටතේ ඉටු කිරීමට නියමිතව තිබුණු, කින්නියා , කන්තලේ ප්‍රදේශයේ වාරි වැවක් ඉදි කිරීම, මීටර් 15 ක ධාරිතාවයෙන් යුත් කළු ගඟ ජලාශ ඉදි කිරීම, ඇල මාර්ග 03 ක් ඉදි කිරිම සහ නින්තරවේදි ප්‍රදේශයේ නව ඉඩම් අක්කර 3000 ක් වගා කිරීම යන කාර්යයන් සඳහා ඉඩම් පවරා ගෙන නොතිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වනවිට ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. තවද ඉදි කර තිබුණු ගෙඩනැගිලි 2 ක් ඉදි කිරිම් කටයුතු නිම කිරිමකින් තොරව අත් හැර දමා තිබුණි. | කින්නියා, කන්තලේ ප්‍රදේශයේ නව ඉඩම් හෙක්ටයාර් 1,214 ක් හා පවතින ඉඩම් හෙක්ටයාර් 8,094 ක් සඳහා වාරි ජලය ද ප්‍රදේශයේ ජනතාවට අවශ්‍යය පානීය ජලය ද ලබාදීමේ අරමුණෙන් 15.5 MCM ජලාශයක් යෝජනා වී තිබිණි. තවද, ජනරංජන වැව පෝෂණය කිරීම, සිංහ වැව, සූරිය වැව, කාන්ති වැව, කුරන්ගුපන්වායන් වැව, වැලේ වැව හා තවත් කුඩා වැව් දෙකක් පෝෂණය කිරීමටද මෙමගින් යෝජනා වී තිබුණි. මෙම කාර්යයන් සඳහා ඉඩම් පවරා ගෙන නොතිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වනවිට ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. තවද ඉදි කර තිබුණු ගෙඩනැගිලි 2 ක් ඉදි කිරිම් කටයුතු නිම කිරිමකින් තොරව අත් හැර දමා තිබුණි. | අතරමඟ වැඩ නවතා දමා ඇති ගොඩනැගිලි වැඩ නිම කිරිමට හා ඵලදායි කාර්යක් සඳහා භාවිතයට අවශ්‍ය පාර්ශවයන් වෙත භාරදීමට කටයුතු කල යුතු වේ. |
| (v) | අදාල කර්තව්‍යයන් නිසි පරිදි ඉටු නොවීම හේතුවෙන් අපේක්ෂිත පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම තුල, එමගින් අපේක්ෂිත ආර්ථික හා සාමාජීය ප්‍රතිලාභ මහජනතාව වෙත ලබා දීමට නොහැකි වී තිබුණි. මේ සඳහා දරන ලද රු.මිලියන 135 ක පිරිවැය අනාර්ථික වියදමක් වී තිබුණි. | -එම - | ව්‍යාපෘතිය නිම කර අරමුණු ප්‍රතිලාභ මහජනයාට ලබා දීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර ව්‍යාපෘතිය නතර කිරීමට හේතු පරීක්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3.4 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පහල මල්වතු ඔය ජලාශ සඳහා වන පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව සකස් කිරීම් කටයුතු 2013 වර්ෂයේදී මහවැලි උපදේශක සේවා කාර්යාංශ (පුද්) සමාගම වෙත පවරා තිබුණි. එම ආයතනය විසින් 2018 මැයි මස ඉදිරිපත් කර තිබුණු පාරිසරික ඇගයීම් තාක්ෂණික කමිටුව (EIA Tech Team) විසින් එම වාර්තාවේ සඳහන් කරුනු හා ක්ෂේතයේ පවත්නා තත්වයන් අතර පරස්පරතාවයන් පවතින බව නිරික්ෂණය කර තිබුණි. අවස්ථා 02 ක් පහත දැක්වේ.<br><br>(i) විල්පත්තු මායිම ලකුණු කරවන වන ජීවි දෙපාර්තමේන්තුව නිදහස් කිරීමට එකඟ වන ඉඩම් පමණක් ඇතුළත් කර ඉතිරි අවශ්‍යය ඉඩම් සඳහා විකල්ප ඉඩම් සොයා ගෙන වන ජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවල එකඟතාවය ලබා ගැනීම.<br>(ii) වව්නියා දිස්ත්‍රික්කයේ නව වගා ඉඩම් සඳහා ඝන වනාන්තර ප්‍රදේශ වෙනුවට ලඳු කැලෑ ප්‍රදේශ හඳුනා ගෙන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබා ගැනීම යන කරුණු දක්වා තිබුණි. | පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා මහවැලි උපදේශන සේවා කාර්යාංශය (පුද්) සමාගම වෙත භාර දී තිබුණේ 2013 වසරේදීය. කෙසේ වෙතත් එම සමාගම විසින් අවසන් වාර්තාව සකසා ඉදිරිපත් කරන ලද්දේ 2018 මැයි මස වන අතර එය මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලදී.<br>මධ්‍යම පරිසර අධිකාරිය විසින් පත් කරන ලද පාරිසරික ඇගයීම් තාක්ෂණික කමිටුව (EIA Technical Team) පහළ මල්වතුඔය ජලාශ ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර නිරීක්ෂණයක් සිදු කරන ලද අතර එහිදී මහවැලි උපදේශන සේවා කාර්යාංශ (පුද්) සමාගම විසින් සකසන ලද පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවේ සඳහන් සමහර කරුණු හා ක්ෂේත්‍රයේ පවත්නා තත්ත්වය අතර පරස්පරතාවයන් පවතින බව අනාවරණය විය. | පාරිසරික ඇගයීම් වාර්තා නිසි කාලයට සිදු කළ යුතු අතර ඒ පිළිබඳව පැනනැඟී ඇති ප්‍රශ්න නිරාකරණය කර ගැනීමට කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පහළ මල් වතු ඔය ජලාශ ව්‍යාපෘති පරීක්ෂාවේදී ජලාශයට අයත් භූමි ප්‍රදේශය සම්බන්ධයෙන් වූ පාරිසරික බලපෑම් ඇගයීම් අධ්‍යයන වාර්තාව සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලැබී නොතිබීම, ජලාශයට යටවන ඉඩම් අක්කර 13,349 ක මැනුම් කටයුතු අවසන් කර තිබුණද එම ඉඩම් අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබීම, ජලාශ ඉදිකිරිම හේතුවෙන් බලපෑමට ලක්වන පවුල් සඳහා ගෙවිය යුතු වන්දි සම්බන්ධයෙන් එකගත්වයකට පැමිණ නොතිබීම, එම පවුල් නැවත පදිංචි කිරීමට හදුනා ගත් ප්‍රදේශයේ යටිතල පහසුකම් වැඩිදියුණු කර , බිම් කොටස් බෙදා වෙන් කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම, ජලාශය ඉදිකිරිම ආරම්භ කිරිම සඳහා අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග සම්පූර්ණ කර නොතිබිම, පහල මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා 2019 අගෝස්තු 30 දින මුල්ගල් තැබීම වෙනුවෙන් සංවිධානය කල උත්සවය සඳහා රු.22,088,598 ක් වැය කර තිබීම යනාදී අඩු පාඩු නිරික්ෂණය විය. | ඉහත කරුණු හේතු කොට ගෙන මධ්‍යම පරිසර අධිකාරියේදී පැවති පාරිසරික බලපෑම් ඇගයීම් තාක්ෂණික කමිටුවේ රැස්වීමකදී පහත සඳහන් තීරණ වලට එළඹෙන ලදී.<br>(i) විල්පත්තු මායිම ලකුණු කර වන ජීවී දෙපාර්තමේන්තුව නිදහස් කිරීමට එකගවන ඉඩම් පමණක් ඇතුළත් කර ඉතිරි අවශ්‍යය ඉඩම් සඳහා විකල්ප ඉඩම් සොයා ගෙන වන ජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවල එකගතාවය ලබා ගැනීම.<br>(ii) වව්නියා දිස්ත්‍රික්කයේ නව වගා ඉඩම් සඳහා ඝන වනාන්තර ප්‍රදේශ වෙනුවට ලඳුකැලෑ ප්‍රදේශ හඳුනාගෙන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ එකගතාවය ලබා ගැනීම.<br>කෙසේ වෙතත් 2020 ජූනි මස වන විට ව්‍යාපෘතිය සඳහා අවශ්‍යය පාරිසරික අනුමැතිය ලබාදීමට අවශ්‍යය සියළුම වාර්තා හා අදාල ආයතන වල නිර්දේශයන් මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලදී. නමුත් එම අනුමැතිය ලැබුණේ 2021 ජනවාරි 20 වන දිනැති ලිපිය මඟිනි.<br>තවද පාරිසරික අනුමැතිය ලැබෙන තෙක් ව්‍යාපෘතියේ කටයුතු කිරීමට නීතිමය අවසරයක් නොමැති බවට “ජාතික පාරිසරික ආරක්ෂාව සඳහා වූ වෘත්තීයවේදීන්ගේ එකමුතුව” විසින්ද මධ්‍යම | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව, ඉඩම් පවරා ගැනීම ආදී කටයුතු සිදු කිරීම කල යුතු වේ. |

පරිසර අධිකාරියට දන්වා තිබූ අතර ඔවුන් ඒ සඳහා නීතිමය පියවර ගැනීමට ඉඩ තිබුණි.

**<u>ජලාශයට මුල්ගල් තැබීම</u>**

පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍යය අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2009 වසරේදීත්, ඉන් පසු සංශෝධිත ඇස්තමේන්තු වියදම යටතේ ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩලඅනුමැතිය 2016 වසරේත් ලැබී තිබුණි.

2019 අගෝස්තු මස වන විට පාරිසරික අනුමැතිය ලබාදීම සඳහා අවශ්‍යය නිර්දේශයන් පුරා විද්‍යා දෙපාර්තමේන්තුව හා වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණි. නිර්දේශ අවශ්‍යතාවය ඉතිරි ව තිබුණේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පමණි.

මෙම ව්‍යාපෘතිය කඩිනමින් ආරම්භ කිරීමේ අවශ්‍යතාවය රජයට පැවති අතර 2019 අගෝස්තු 06 වන දින කෘෂිකර්ම අමාත්‍යාංශයේ දී පැවති රැස්වීමේදී ගත් තීරණයකට අනුව,

(i) පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා ඉල්ලා ඇති වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් නිදහස් කිරීමේ ලිපිය 2019 අගෝස්තු 09 දිනට පෙර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කිරීම.

(ii) එම ලිපිය ඉදිරිපත් කිරීමෙන් පසු මධ්‍යම පරිසර අධිකාරිය විසින් ව්‍යාපෘතියට පාරිසරික අනුමැතිය 2019 අගෝස්තු 20 දිනට පෙර ලබා දීම.

ඒ අනුව, වන සංරක්ෂණ හා මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය මත පහළ මල්වතුඔය ජලාශය සඳහා මුල්ගල තැබීමේ උත්සවය 2019 අගෝස්තු 30 වන දින අති ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කිරීමට තහවුරු කරන ලදී.

<u>උත්සවය සඳහා වියදම් දැරීම</u>

2019 වසරේ විශාල මුදලක් වෙන් කර නොතිබුන මුත් අනිත් ව්‍යාපෘතිවල ඉතිරි වී ඇති ප්‍රතිපාදන මෙම ව්‍යාපෘතියට මාරුකිරීමේ හැකියාව ඇති නිසා මුල්ගල තැබූ දින සිට ඉදිකිරීමේ කටයුතු කරගෙනයාමේ අරමුණින්, 2019 අගෝස්තු 30 වන දින මුල්ගල තැබීම සිදුකරනලදී. යෝජිත උත්සවය අති ගරු ජනධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු රජයේ මැති ඇමතිවරුන් විශාල ප්‍රමාණයකගේ සහභාගීත්වයෙන් පැවැත්වෙන ජාතික උත්සවයක් වන බැවින් ජනාධිපති හා අග්‍රාමාත්‍ය ආරක්ෂක අංශ වලද එකඟතාවය සහිතව සංවිධානය කල යුතුව ඇති බැවින් හා අදාළ ප්‍රමිතීන්ගෙන් තිබිය යුතු බැවින් එම උත්සවය සඳහා විගණන විමසුමේ සඳහන් මුදලක් වැය දරා තිබූ බව.

**3.5 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) දේශගුණික අවබලපෑම් අවම කිරිමේ ව්‍යාපෘතිය** | | |
| (i) මන්නාරම යෝධ වැවෙහි වම් ඉවුර ඇල බැම්ම දෙපස තණ පිඩලි අල්ලා සංවර්ධන කිරිම වෙනුවෙන් රු.4,544,430 ක් ගෙවා තිබුණි. භෞතික පරික්ෂාවට අනුව කොන්ත්‍රාත්කරු විසින් නියමිත පරිදි ඇල බැම්ම දෙපස පිඩලි අල්ලා නොතිබුණු අතර ඒ හේතුවෙන් බැම්මේ දෙපස සෝදා පාලුවට ලක්වී තිබුණි. තවද බැම්මේ මතුපිට පළල මීටර් 4 ක් වනසේ ඉදි කල යුතුව පැවතුණද මතුපිට පළල නියමිත ප්‍රමාණයට ඉදි කර නොතිබුණු අතර විවිධ අගයන්ගෙන් යුතු විය. ඒ හේතුවෙන් බැම්මට හානි සිදු විමට ඉඩකඩ පැවතුණි. | මෙම කොන්ත්‍රාත්තුව 2017 මාර්තු මස ආරම්භ කර 2018 මාර්තු මස අවසන් කර ඇති බවත් කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කර වසර 03 ක පමණ කාලයක් ගත වී ඇති බවත් මන්නාරම ප්‍රදේශයට පවත්නා දැඩි නියඟය හේතුවෙන් අතුරන ලද පිඩලි වියලි විනාශ වී ගොස් ඇති බවත් තවද මෙම ප්‍රදේශය තුල ගවයන් , එළුවන් හා ධීවර කර්මාන්තය කෙරෙන බැවින් මෙම ඇල බැම්මේ දෙපස හානියට පත් ව ඇති බව මන්නාරම වාරිමාර්ග අධ්‍යක්ෂවරයා විසින් පවසා ඇත. ගවයන් හා එළුවන් බැම්ම මත ගමන් කිරිම තුලින් ඇල බැම්මට හානි වන බවත් මෙම හානිය වලක්වාගත නොහැකි බවත් වාර්ෂිකව වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් නඩත්තු කටයුතු සඳහා ලබාදෙන ප්‍රතිපාදන යටතේ මෙම හානියට පත් කොටස් අලුත්වැඩියා කර ගැනීමට කටයුතු කරන බවත් වාරිමාර්ග අධ්‍යක්ෂවරයා විසින් දන්වා ඇත. | සැලැසුම් කළ පරිදි ඉදිකිරීම් සිදු කිරීමට කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | මන්නාරම වෙල්ලක්කඹිඹු ජලාශයේ වැව් බැම්ම ඉදි කිරිම සඳහා වු පස් එම ස්ථානයේ සිට කිලෝ මීටර් 1.2 ක් දුරින් ප්‍රවාහනය කරන බව මුලික ඇස්තමේන්තුවේ සඳහන් වුවද කොන්ත්‍රාත්කරු විසින් වැව් බැම්ම සඳහා අවශ්‍ය පස් වැව් පතුලෙන් ලබා ගෙන තිබුණි.තවද වැව් බැම්මේ පිඩලි ඇල්ලීම සඳහා වැඩ අයිතම 6.4 යටතේ රු.659,214 යටතේ ඇස්තමේන්තු කර තිබුණද එම වැඩ අයිතමය ඉටු කිරිමකින් තොරව කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. | වැව් පතුලේ වු පස් ඉංජිනේරු රසායනාගාරයක් තුල පරීක්ෂා කිරිමේදී වැව් බැම්ම සඳහා සුදුසු බව තහවුරු වු හෙයින් එම පස් බැම්ම සඳහා යොදා ගන්නා ලද බව මන්නාරම වාරිමාර්ග ඉංජිනේරු විසින් දන්වා ඇත. වැව් බැම්මේ පිඩලි ඇල්ලිමේ කාර්යය කොන්ත්‍රාත්කරු විසින් ඉටු කර තිබුණු අතර වියළි කලාපයේ ජලය යොදා පිඩලි ආරක්ෂා කර නොතිබුණු බැවින් පිඩලි වේලී විනාශ වී ගොස් තිබු හෙයින් ඒ සඳහා ගෙවීම් නොකරන ලද බව තව දුරටත් දන්වා ඇත. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතු වේ. |

**4. මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ අනුමත කාර්යය මණ්ඩලය 179 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 139 ක් විය. ඒ අනුව , ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 09 ක, තෘතියික මට්ටමේ තනතුරු 02 ක , ද්විතියික මට්ටමේ තනතුරු 27 ක සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 ක් වශයෙන් පුරප්පාඩු **40** ක් පැවතුණි. ඒවා සම්පූර්ණ කිරිමට කටයුතු කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්යය මණ්ඩලය සම්පූර්ණ කිරීම සඳහා අදාළ ආයතන වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. ජ්‍යෙෂ්ඨ මට්ටමේ දැනට පවතින පුරප්පාඩු **09** අතුරින් වැඩිමනත් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අදාල වන අතර ඒ සඳහා ඉංජිනේරු සේවා මණ්ඩලය විසින් විභාග පවත්වා බඳවා ගැනීමට අදාල අනුමැතිය ලබාගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. අනුමැතිය ලැබීමෙන් පසු අදාල පුරප්පාඩු පිරවීමට නියමිතය. තවද ද්විතීයික මට්ටමේ සංවර්ධන නිලධාරී තනතුරු ඇතුළුව තවත් තනතුරු විශාල ප්‍රමාණයක් මේ වන විට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් සම්පූර්ණ කර ඇත. | තනතුර අවශ්‍යතා සමාලෝචනයට ලක් කර අවශ්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරිමට කටයුතු කල යුතු වේ. |